# 2012

# කාර්යසාධන වාර්තාව
## செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT

මහා භාරකාර දෙපාර්තමේන්තුව

பொது நம்பிக்கை பொறுப்பு திணைக்களம்

Department of Public Trustee



"මේ රටේ නිදහස උත්තරීතරය, කිසිදු බෙදුම්වාදයකට මම ඉඩක් නොතබමි. කිසිම අයකුට අප රටේ ජන සම්මතවාදය විනාශ කිරීමට මම ඉඩ නොදෙන්නෙමි. අපේ රටේ ශිෂ්ටාචාරය ගොඩනැගුනේ මෙත්තා, මුදිතා, කරුණාව තුලිනි. මිනිසා පමණක් නොව සතා සිව්පාවා ගහකොළ මහ පොළව දක්වා පැතිරුණු මෙත් සිත එහි පදනම විය. විවිධ හේතු නිසා ඉරිතැලී ගිය මේ සිත් නැවත එක් ජාතික අරමුණකට ගොනු කරවීම මාගේ අපේක්ෂාවයි. සියල්ලන්ගේ ජාතික හා ආගමික අනන්‍යතාවයන්ට ගරු කිරීම කිසිවෙකුට බලය යොදා හිරිහැර නොකිරීම, පුද්ගල නිදහස හා සමාජ නිදහස සුරැකෙන නව සමාජයක් බිහිකිරීම මාගේ බලාපොරොත්තු වේ."

\- මහින්ද චින්තන ඉදිරි දැක්ම.... -

දැක්ම

*පරිත්‍යාගශීලි දානපතියන් විසින් මහා භාරකාරතැන කෙරෙහි තබන ලද විශ්වාසය අනුව විවිධ කාර්යයන් සඳහා යෙදවීමට පරිත්‍යාගකරන ලද මුදල්/දේපලඅදාළස්ථාපකවරුන්ගේද තෙස්තමේන්තුකරුවන්ගේද පොදු මහජනතාවගේද අභිලාෂයන් සහ අවශ්‍යතාවයන් සපිරෙන පරිද්දෙන් නෛතික රාමුවක් තුළ සැමට උපරිම ප්‍රතිලාභයක් සලසමින් විශ්වාසනීය භාරකරුවකු වශයෙන් ක්‍රියා කිරීම.*

මෙහෙවර :

*දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද දේපළ, මුදල්, වන්දි සහ මුදල්, වෘත්තිමය දැනීම සහ නිපුණතාවය මත පරිපාලනය, කළමණාකරනය සහ ආයෝජනය කරමින් ඒවායේ අර්ථලාභීන් / උරුමකරුවන් / යැපෙන්නන් / ලබන්නන් හට විශ්වාසනීය, කාර්යක්ෂම සහ ඵලදායි සේවාවක් ලබා දීම.*

මහා භාරකාර ධූරය සහ නෛතික ශක්නුතාවය

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මගින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මගින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මගින් සංශෝධිත 1922 අංක 01 දරණ මහා භාරකාර ආඥා පනත මගින් ශ්‍රී ලංකාව තුළ මහා භාරකාර ධූරය,ස්වාධීන අවිච්චින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිතව ස්ථාපිත කොට ඇති අතර, ධූරයේ නාමයෙන් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට නෛතික ශක්නුතාවයක් සහිත වේ.

මෙම ධූරයට අමතර වශයෙන් නියෝජ්‍ය මහා භාරකාර ධූරයන් දෙකක් උක්ත පනත මගින් ස්ථාපනය කොට ඇත.

නෛතික කාර්යභාරයක් ඉටුකරන එකී ධූරයන් සඳහා නිළධාරීන් තෝරා පත්කරගැනීමේදී ප්‍රධානම සුදුසුකම වන්නේ නීතිඥවරයෙකු වීමය.

නෛතික පසුබිම :

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මගින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මගින් ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මගින් සංශෝධිත 1922 අංක 1 දරණ මහා භාරකාර ආඥා පනත යටතේමහා භාරකාර ධූරය ස්වාධින නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇති අතර, අදාල ආඥා පනත් අනුව ආයතනය සහ ඒ අනුෂංගික කරුණු පාලනය වේ.

භාර සම්බන්ධයෙන් මහා භාරකාර ආඥාපනතට අමතරව 1918 අංක 04,1934 අංක 01 දරණ ආඥා පනත් මගින් ද 1968 අංක 07 සහ 1971 අංක 30 දරණ පනත් මගින් ද සංශෝධිත 1917

අංක 09 දරණ භාර ආඥා පනත බල පැවැත්වෙන අතර, එකී පනත නිහඬවන්නා වූ යම් අවස්ථාවකදී ඉංග්‍රීසි සාධාරණත්ව (Law of Equity) අදාල වේ.

කාර්ය භාරය

මහා භාරකාර ආඥා පනත, සිවිල් නඩු විධාන සංග්‍රය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්ය භාරයන් මහා භාරකාරතැන වෙත පැවරී ඇත.

1. සාමාන්‍ය භාරකාරුවකු,රැකවරණ භාරකරුවකු හෝ ආරක්‍ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
2. දේපල රැස් කිරීමේ නියෝග යටතේ දේපළ රැස් කිරීම
3. බාල වයස්කරුවකුගේ දේපල භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්‍ෂක කළමණාකරුවකු) ලෙස කටයුතු කිරීම. (දිසා අධිකරණය මගින් පවරන ලද අවස්ථාවක)
4. සිහි විකල් පුද්ගලයෙකුගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.(දිසා අධිකරණය මගින් පවරන ලද අවස්ථාවක)
5. නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමණාකරුවකු ලෙස කටයුතු කිරීම.
   (ආරක්‍ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවල දී එම භාරයන්හි පත්කර ඇති " භාරකාර මණ්ඩලය" මගින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්‍ෂක භාරකරු බැඳී සිටී).
6. විදේශගත වූ ශ්‍රී ලාංකිකයකුගේ ඇටෝර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබා දීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
7. සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මගින් දේපල සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
8. ගරු අධිකරණය මගින් පවරන අවස්ථාවලදී අන්තිම කැමති පත්‍රයක් රහිත පුද්ගලයෙකුගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.
9. අධිකරණ සංවිධාන පනත මත දේපළ රැස්කරන්නෙකු ලෙස කටයුතු කිරීම.
10. වරදකට සිරගතවූවකුගේ දේපළ කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.
11. ඕනෑම පුද්ගලයෙකුගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැනැපත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.
12. විහාරස්ථ දේපළෙහි භාරකරු වශයෙන් කටයුතු කිරීම.

උක්ත කාර්යයන් හැර වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි මහා භාරකාර තැනගේ මැදිහත් වීම.

මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව පැවරී ඇති වෙනත් කාර්යයන්.

- 1988 අංක 61 දරණ පනත මගින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගත වන්නන්,විදේශයක දී මිය ගිය හොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් සහ/හෝ නිත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම කාර්යක්ෂම සහ නිවැරදි ලෙස සිදු කිරීම සහ එකී කාර්යය පහසු කිරීම සඳහා අදාළ සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම.

- 1944 අංක 42 දරණ විහාර ඉඩම් (වන්දි) ආඥා පනත ක්‍රියාත්මක කිරීම.

- 1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විහාර දේවාලගම් පනත යටතේ පැවරි ඇති කාර්යයන් ඉටුකිරීම.

- 1973 අංක 28 දරණ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස් වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.

මහා භාරකාර තැනගෙන් සැලසෙන සේවාවන්.

මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාර වල අරමුණු අනුව / අන්තිම කැමති පත්‍රවල අරමුණු අනුව / අධිකරණ නියෝග මත පහත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය කරනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත් දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාර අවශ්‍ය රෝගීන්ට වෛද්‍ය ප්‍රතිකර ලබා ගැනීම සඳහා වෛද්‍යාධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාර වල අරමුණු අනුව මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු
- විවිධ හේතුන් නිසා ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහ එවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරාගන්නා ලද නිශ්චල දේපළසඳහා හිමිවනවන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශ මත බෙදාහැරීම.

- භාර/ බූදල් දේපළ කළමනාකරණය කිරීම.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය දුෂ්කරතා ඇති දක්ෂ දරුවන් දිරිමත් කිරීම අරමුණු කොට ඇති භාරයන්ගෙන් ආදායම උපයෝගි කරගනිමින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය දෙදෙනෙකු හා සභාපති පත් කිරීම.

- විදේශ වන්දි බෙදාහැරීම.

- විභාර වන්දි බෙදාහැරීම.

- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමෙන් ප්‍රතිශතයක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබා දීම. (2012 වසරේ රු.6,543,360.52 ක මුදලක් රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ලබා දී ඇත.)

<u>භාර බූදල් සංඛ්‍යාව</u>

2012.12.31 දිනට දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාර සංඛ්‍යාව 999 ක් වන අතර, දෙපාර්තමේන්තුව මගින් පාලනය වන බූදල් සංඛ්‍යාව 126 කි. භාර ආරම්භ කළ දානපතින්ගේ අරමුණු අනුව අදාල කාර්යයන් ඉටු කරනු ලැබේ.

| වර්ෂය | ක්‍රියාත්මක භාර සංඛ්‍යාව | ක්‍රියාත්මක බූදල් සංඛ්‍යාව |
|---|---|---|
| 2010 | 957 | 115 |
| 2011 | 981 | 119 |
| 2012 | 999 | 126 |

රාජ්‍ය භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති මුදල් ප්‍රමාණය

| වර්ෂය | මුදල (රු.) |
|---|---|
| 2010 | 4,237,608.18 |
| 2011 | 3,783,187.40 |
| 2012 | 6,543,360.52 |

<u>2012.12.31 දිනට දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර</u>

| අනු අංකය | තනතුර | අදාල වන සේවය | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ යෙදෙන සංඛ්‍යාව | පුරප්පාඩුව |
|---|---|---|---|---|---|
| 01 | මහා භාරකාරතැන | දෙපාර්තමේන්තුගත | 01 | 01 | - |
| 02 | නියෝජ්‍ය මහා භාරකාරතැන | දෙපාර්තමේන්තුගත | 02 | 01 | 01 |
| 03 | ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. (Iපන්තිය) | 01 | 01 | - |
| 04 | ගණකාධිකාරි | ශ්‍රී.ලං.ග.සේ. (II/III පන්තිය) | 01 | - | 01 |
| 05 | අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. (II/III පන්තිය) | 01 | - | 01 |
| 06 | පරිපාලන නිලධාරි | රා. ක.ස. සේ. (අධි පන්තිය) | 01 | 01 | - |
| 07 | සංවර්ධන සහකාර | ආශ්‍රිත නිලධාරි | 07 | 07 | - |
| 08 | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | 01 | - | 01 |
| 09 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා. කළ. ස. සේවය | 28 | 27 | 1 |
| 10 | කාර්යාල සේවක සේවය | කා. සේ. සේ. | 13 | 08 | 05 |
| 11 | රියදුරු | රියදුරු සේවය | 4 | 1 | 3 |
| 12 | ලිපිකරු | දෙපාර්තමේන්තුගත■ | 3 | 2 | - ■ |
| 13 | යතුරු ලේඛක | දෙපාර්තමේන්තුගත | 1 | 1 | - |
| එකතුව | | | **64** | **50** | **13** |

■ *දෙපාර්තමේන්තුගත ලිපිකරු තනතුර සඳහා අනුමැතිය ලැබී ඇත්තේ එම තනතුර පුරප්පාඩු වූ පසු නැවත බඳවා ගැනීමට අවසර නොලැබෙන ලෙසය.*

මෙම දෙපාර්තමේන්තුව භාරයේ පවතින භාර හා බුදල් යටතේ 2012/12/31 දිනට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වැඩසටහන්

| විස්තරය /**Description** | වෙන් වූ ප්‍රතිපාදන /**Allocated Funds (000)** | ක්‍රියාකාරකම් /**Activity** |
|---|---|---|
| අධ්‍යාපන /General Education | 3,384 | අඩු ආදායම්ලාභීන්ගේ පවුල්වල දක්‍ෂතාවය ඇති දරුවන් එක් අයෙකුට මාසිකව රු.300/- බැගින් උසස් පෙළ දක්වා අධ්‍යාපන හැදෑරීමට ශිෂ්‍යත්ව 727 ක් ලබා දී ඇත. |
| උසස් අධ්‍යාපන /Higher Education | 1,212 | අඩු ආදායම් ලාභීන්ගේ පවුල්වල දක්‍ෂතාවය ඇති දරුවන්ට, විශ්ව විද්‍යාල අධ්‍යාපනය හැදෑරීම සඳහා එක් අයෙකුට මාසිකව රු.500/- බැගින් ශිෂ්‍යත්ව 295 ක් ලබා දී ඇත. |
| අසරණ රෝගීන්ට වෛද්‍යාධාර ලබා දීම / Medical Donation for patients | 3,289 | මේ යටතේ අසරණ වූ, වකුගඩු හදවත් සහ පිළිකා රෝගීන් 180 ක් සඳහා ආධාර ලබා දෙන ලදි. |
| ආගමික කටයුතු / Religious Affairs | 1,305 | ආගමික සිද්ධස්ථාන නඩත්තුව හා සංවර්ධනය සඳහා ආගමික ස්ථාන 504 කට ආධාර ලබා දී ඇති අතර, මේ අරමුණ සඳහා භාර 342 හා බුදල් 9 ක් පරිත්‍යාගශීලීන් විසින් පිහිටුවා ඇත. |
| විදේශ වන්දි /Foreign Compensation | 187,487 | විදේශයන්හි මියගිය පුද්ගලයින් වෙනුවෙන් ලද වන්දි මුදල් උරුමකරුවන්ට ලබා දී ඇත. |
| අසරණාධාර ලබාදීම / Relief Donations | 1,051 | දැඩි ආර්ථික අපහසුතාවයන්ගෙන් පෙළෙන දිළිඳු අසරණයන්ට හා ආර්ථික දුෂ්කරතා ඇති විහාරස්ථාන වල ආගමික උත්සව සඳහා ආධාර 238ක් ලබා දී ඇත. |
| විහාර වන්දි නිදහස් කිරීම | 43,131 | විහාරස්ථාන සතු ඉඩම් රජයට පවරා ගැනීම වෙනුවෙන් ලැබී ඇති වන්දි මුදල් අතරින්විහාරස්ථාන 47ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා මුදල් නිදහස් කර ඇත. |

2012 වර්ෂය සඳහා විහාරාධාර ලබාදීම.

| බුද්ධලය | මුදල (රු.) | විහාරස්ථාන ගණන |
|---|---|---|
| ශ්‍රීමත් ඩී. බී. ජයතිලක බුද්ධලය | 765,000.00 | 06 |
| වනිගසූරිය බුද්ධලය | 4,533,200.00 | 115 |
| එකතුව | 5,298,200.00 | **121** |

| බුද්ධලය | මුදල (රු.) | විහාරස්ථාන ගණන |
|---|---|---|
| ආගමික සමාජ සේවා පොදු අරමුදල් භාරය | 4,905,000.00 | 41 |
| එකතුව | 4,905,000.00 | **41** |

රජය මගින් ලබාදෙන ප්‍රතිපාදන මගින් ඉටුකරනු ලබන කාර්යයන්

| විෂය අංකය | විෂය විස්තරය | නිත්‍ය ප්‍රතිපාදන | 2012/12/31 දිනට මුළු වියදම | ඉතිරි ප්‍රතිපාදන |
|---|---|---|---|---|
| | පුනරාවර්තන වියදම් | | | |
| 1001 | වැටුප් හා වේතන | 12,000,000/- | 11,918,792/81 | 81,207/19 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 440,000/- | 417,614.80 | 22,385.20 |
| 1003 | වෙනත් දීමනා | 5,200,000/- | 6,698,456,91 | (1,498,456.91) |
| 1101 | දේශීය | 250,000/- | 249,923.63 | 76.37 |
| 1102 | විදේශීය | - | - | - |
| 1201 | ලිපි හා කාර්යාල අවශ්‍යතා | 750,000/- | 731,444.04 | 18,555.96 |
| 1202 | ඉන්ධන | 1,200,000/- | 1,167,528.00 | 32,472.00 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 11,524/- | 11,523.50 | 0.50 |
| 1301 | වාහන | 245,820/- | 245,819.63 | 0.37 |
| 1301 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකණ | 124,143/- | 124,142.40 | 0.60 |
| 1401 | ප්‍රවාහන | - | - | - |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 850,000/- | 839,215.03 | 10,784.97 |
| 1403 | විදුලිය හා ජලය | 600,000/- | 583,921.91 | 16,078.09 |
| 1404 | බදු කුලී හා පලාත් පාලන ආයතන | 5,400,000/- | 5,400,000/- | - |
| 1405 | වෙනත් | 830,500/- | 823,223.48 | 7,276.52.00 |
| 1506 | දේපළ ණය පොලී | 218,052/- | 218.051.24 | 0.76 |
| 1509 | පාඩු හා කපාහැරීම් | 8,152/- | 8,152.00 | - |
| | පුනරාවර්තන එකතුව | 28,128,191/- | 29,437,809.38 | 188,838.53 |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 121,000/- | 100,511.57 | 20,488.43 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000/- | 56,910.75 | 43,089.25 |
| 2003 | වාහන | 200,000/- | 183,775.55 | 16,224.45 |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 194,027 | 194,026.60 | 0.40 |
| 2013 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 170,282 | 159,015.00 | 11,267.00 |
| 2104 | පුහුණු කිරීමේ හා ධාරිතා වර්ධනය | 58,500/- | 58,500/- | - |
| | මූලධන එකතුව | 843,809/- | 752,739.47 | 91,069.53 |
| | මුලු එකතුව | 28,972,000 | 30,190,548.85 | 279,908.06 |

රජයේ වාර්ෂික අය වැය ලේඛනය මගින් පසුගිය වසර තුන සඳහා කළ වෙන් කිරීම.

<u>මූල්‍ය ප්‍රගතිය</u>

| | ශුද්ධ වෙන් කිරීම් | වියදම් |
|---|---|---|
| 2010 | | |
| පුනරාවර්තන | 28,774,000 | 27,899,283 |
| මූලධන එකතුව | 6,073,000 | 5,768,922 |
| මුලු එකතුව | 34,847,000 | 33,668,205 |
| | | |
| 2011 | | |
| පුනරාවර්තන | 29,737,383 | 29,301,643 |
| මූලධන එකතුව | 1,383,617 | 1,295,184 |
| මුලු එකතුව | 31,121,000 | 30,596,827 |
| | | |
| 2012 | | |
| පුනරාවර්තන | 29,850,648 | 29,716,129 |
| මූලධන එකතුව | 922,809 | 763,739 |
| මුලු එකතුව | 30,773,457 | 30,479,868 |